ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>දිවයින පුරා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300 දෙනෙකු සඳහා මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමේ</u>**

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මැතිනිය අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය මධුර සෙනෙවිරත්න මැතිතුමා සහ වැඩබලන මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මැතිතුමා හා එක්ව දිවයින පුරා උසස් පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300 දෙනෙකු සඳහා මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනමන ලදී. මෙම විශේෂ උත්සවය අද දින අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්විණ.

2. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ අඩු ආදයම්ලාභි පවුල්වල උසස් පෙළ හදාරන දක්ෂ සිසු සිසුවියන් සඳහා විශේෂයෙන්ම එක් එක් දිස්ත්‍රික්කයේ දක්ෂතා සපිරි සිසුන් 6 දෙනා ඉලක්ක කර ගනිමින් මසකට ශ්‍රී ලංකා රුපියල් 2,500ක් ලබා දේ. මෙවර උත්සවයේදී 2021 සිට 2024 දක්වා කාලය ආවරණය කරමින් එකවර කණ්ඩායම් දෙකකට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරිම විශේෂත්වයකි.

3. අග්‍රාමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මැතිනිය මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව ලබා දීම සහ ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන විවිධ මූලපිරීම් සම්බන්ධයෙන් සිය කෘතඥතාවය පළ කළාය. ශිෂ්‍යත්වලාභීන්ට සුබපැතුම් පිරිනැමූ අග්‍රාමාත්‍යතුමිය ගාන්ධිතුමාගේ චින්තනය සහ අදහස් ද සිසු සිසුවියන් සමඟින් බෙදා ගත් අතර එතුමා විසින් පෙන්වා දුන් මාර්ගයේ ගමන් කරන ලෙස ඔවුන් දිරිමත් කළේය.

4. මේ අතර ශිෂ්‍යත්ව දිනාගැනීම සම්බන්ධයෙන් සිසු සිසුවියන්ට ශුභාශිංසන පිරිනැමූ වැඩබලන මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මැතිතුමා මහත්මා ගාන්ධි ශිෂ්‍යත්වය අවශ්‍යතා සහිත දක්ෂ සිසු සිසුවියන්ට පිරිනමන මූල්‍ය සහයෝගයක් පමණක් නොව ජීවිත කාලයටම පිළිගැනීමක් ලැබෙන ජයග්‍රහණයක් බව සඳහන් කළේය. ශිෂ්‍යත්වලාභීන් වශයෙන් අධ්‍යාපනය අතින් දස්කම් දක්වන ලෙස ද ජීවිත කාලය පුරා මහත්මා ගාන්ධි යන ශ්‍රේෂ්ඨ නායකයාගේ උතුම් අදහස් සම්පව ඇසුරු කරමින් ඒවා අන් අය සමඟ ද බෙදා ගන්නා ලෙස එතුමා සිසු සිසුවියන්ගෙන් ඉල්ලා සිටියේය.

5. මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව යෝජනාක්‍රමයට අමතරව ඉන්දියානු රජය ඉංජිනේරු, තාක්ෂණ, කලා, විද්‍යා සහ දේශීය වෛද්‍ය වැනි අංශයන් සඳහා වාර්ෂිකව ශිෂ්‍යත්ව 210ක් පමණ පිරිනමයි. ITEC යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ රජයේ

නිලධාරීන් සඳහා පූර්ණ ශිෂ්‍යත්ව 400කට අධික ප්‍රමාණයක් ද පිරිනමනු ලබයි. 2024 දෙසැම්බර් මස ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් සිදු කළ ඉන්දීය සංචාරය අතරතුරදී වසර 5ක් පුරා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයන් 1,500 දෙනෙකුට ඉන්දියාවේදී පුහුණුව ලබා දීම සඳහා වන අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. එසේම, මෙයට අමතරව ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී වාර්ෂිකව ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් සඳහා විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව නිවේදනය කරන ලදී. සමස්තයක් වශයෙන් ගත් කළ ඉන්දියාවේ ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් තුළින් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1,000කට පමණ දැනුම හුවමාරු කර ගැනීමේ සහ වෘත්තීය සංවර්ධන අවස්ථාවන් ලබා දේ. මෙම අවස්ථාවන් පිරිනමනු ලබන්නේ ඉන්දීය තාක්ෂණ සහ ආර්ථික සහයෝගිතා වැඩසටහන වැනි දැනට පවතින පුහුණු වැඩසටහන්වලට අමතරව වීම විශේෂත්වයකි.

***

**කොළඹ**

***2026*** *පෙබරවාරි* ***09***